# අප කළ යුත්තේ කුමක්ද?

**...දිනට කලින් නිකුත් කළ ගෘහස්ථ හිංසන විධාන සඳහා:** ඔබව ජාතික තලය තුළ ආරක්ෂිත බව තහවුරු කරගැනීම සඳහා ඔබේ ගෘහස්ථ හිංසන විධානය ඕනෑම වෙලාවක ප්‍රකාශයට පත් කිරීමේ හැකියාව ඇත.

25
2017 නොවැම්බර්

ඕස්ට්‍රේලියාවේ ඕනෑම උසාවියකට අයදුම් කිරීමෙන් ඔබට මෙය කළ හැකිය. එය ඔබට නියෝගය නිකුත් කළ ප්‍රාන්තයේ හෝ පළාතේ අධිකරණයක් වීම අවශය නොවේ.

ඔබ ඕස්ට්‍රේලියාවේ වෙනත් ප්‍රාන්තයකට හෝ පළාතකට යාමට හෝ එහි පදිංචි වීමට අදහස් නොකරන්නේ නම් ඔබේ නියෝගය අනාවරණය නොකර සිටීමට ඔබට පුළුවන. ගෘහස්ථ හිංසන විධානයක් නිකුත් කළ ප්‍රාන්තයේ හෝ පළාත තුළ ඔබ ආරක්ෂිතය.

**...දින හෝ ඊට පසුව නිකුත් කරන ලද ගෘහස්ථ හිංසන විධානයන් සඳහා:** ඔබේ ගෘහස්ථ හිංසන විධානය ජාතිකව පිළිගනු ලැබෙන අතර ඔබට ඒ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමක් අවශය නොවේ.

25
2017 නොවැම්බර්

# වැඩිදුර විස්තර

ඔබට වැඩිදුර ක්‍රියාමාර්ගයක් ගතයුතුද නැද්ද යන්න පිළිබඳ විශ්වාෂයක් නැත්නම් හෝ ඔබට වෙනත් ගැටළුවන් ඇත්නම්, **www.ag.gov.au/ndvos** වෙබ් අඩවියට පිවිසෙන්න. ඔබේ ප්‍රාන්තයට හෝ පළාතට අදාළ තොරතුරු සඳහා ඔබේ ප්‍රාදේශීය උසාවිය අමතන්න.

Initiative of
ACT Government
NSW Government
Northern Territory Government
Queensland Government
Government of South Australia
Tasmanian Government
Victoria State Government
Government of Western Australia

Australian Government

**www.ag.gov.au/ndvos**

# ජාතික බලගැන්වීම

## ගෘහස්ථ හිංසන විධාන

ජාතික ගෘහස්ථ හිංසන විධාන පරිපාටිය/ හඳුන්වා දී ඇත

සිංහල / Sinhalese

National Enforcement of Domestic Violence Orders

**www.ag.gov.au/ndvos**

ජාතික
බලගැන්වීම
ගෘහස්ථ හිංසන විධාන

## පසුබිම

පවුල් සහ ගෘහස්ථ හිංසනය අනුමත කළ නොහැකිය. හිංසනයට ලක්වූවන්ගේ ආරක්ෂාව අතිශයින් වැදගත්ය.

ගෘහස්ථ හිංසනයට ලක්වූවන්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම පිණිස රට පුරා නව නීති හඳුන්වා දී ඇත.

අතීතයේදී, ගෘහස්ථ හිංසන විධාන (DVOs) ඒවා නිකුත් කළ ප්‍රාන්තය හෝ පළාතට පමණක් වළංගු විය.

දැන් එය වෙනස් වී ඇත.

2017 නොවැම්බර් 25 වන දින නව ගෘහස්ථ හිංසන විධාන පරිපාටිය ආරම්භ විය. 2017 නොවැම්බර් 25 දින සිට නිකුත් කරන ලද සියලුම ගෘහස්ථ හිංසන විධාන ස්වයංක්‍රීයවම ජාතික වශයෙන් පිළිගනු ලැබෙයි. එසේම ජාතික වශයෙන් බලාත්මකද වේ.

## හිංසනයට ලක්වූවන් ආරක්ෂා කිරීම

ජාතික ගෘහස්ථ හිංසන විධාන පරිපාටිය හිංසනයට ලක්වූවන් සහ ඔවුන්ගේ පවුල් සඳහා වන ආරක්ෂාව තර කරයි.

ඔබේ ගෘහස්ථ හිංසන විධානය ඕස්ට්‍රේලියාවේ වෙනත් ප්‍රාන්තයක හෝ පළාතක බලාත්මක වනු පිණිස එහි ලියාපදිංචිය සඳහා අයදුම් කිරීම තවදුරටත් අවශ්‍ය නොවේ.

ඔබට දැනට 2017 නොවැම්බර් 25 ට පෙර නිකුත් කරන ලද ගෘහස්ථ හිංසන විධානයක් ඇත්නම්, උසාවියකට අයදුම්පතක් යොමු කිරීමෙන් එය ජාතික මට්ටමින් පිළිගන්නා එකක් බවට පත්කර ගත හැකිය.

ඕස්ට්‍රේලියාවේ පුරා ඇති ආදේශීය උසාවියකට ජාතික වශයෙන් පිළිගත් ගෘහස්ථ හිංසන විධානයක් සංශෝධනය කළ හැකිය. එය නිකුත් කරන ලද්දේ කොහේද යන්න මෙහිදී බල නොපායි.

නිකුත් කරන ලද්දේ කෙදිනද යන්න නොතකා, සිය ප්‍රාන්තය හෝ පළාත තුළදී නිකුත් කරන ලද සියලු ගෘහස්ථ හිංසන විධානයන්ට අයත් කොන්දේසි බලගැන්වීමට ප්‍රාදේශීය පොලීසියට හැකිය.

හිංසනයට ලක්වූවන් සහ ඔවුන්ගේ පවුල් ගෘහස්ථ හිංසනයෙන් ආරක්ෂා කරන වත්මන් ප්‍රාන්ත සහ පළාත් නීති වෙනස් වී නොමැත.




## ගෘහස්ථ හිංසන විධාන බලගැන්වීම

ගෘහස්ථ හිංසන විධානයේ ඇති කොන්දේසි අනුව කටයුතු නොකිරීම සාපරාධී වරදකි.

ගෘහස්ථ හිංසන විධානයක් තවදුරටත් ප්‍රාන්ත හෝ පළාත් මායිම්වලට සීමා නොවේ. නිකුත් කරන ලද සියලු ගෘහස්ථ හිංසන විධානයන් ඕස්ට්‍රේලියාව පුරාවට බලපැවැත්වේ.

---

ඔබේ ප්‍රාන්තයේ හෝ පළාතේදී ගෘහස්ථ හිංසන විධානයක් මැදහත් වීමේ නියෝගයක්, පවුල් හිංසන විධානයක්, පරිගෘහිත ගෘහස්ථ හිංසන විධානයක් හෝ පරිහාර නියෝගයක් වශයෙන් හඳුන්වනු ලැබිය හැකිය.

---

අපට දැන් පෙරටත් වඩා හොඳින් ඕස්ට්‍රේලියානුවන් ආරක්ෂා කළ හැකියි
**www.ag.gov.au/ndvos**